**ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව**
**මහ සභා රැස්වීම.**
**2022.09.16**

**සහභාගි වූ සභික නාමාවලිය :-**

01. ගරු සභාපති.ඩබ්.සුරන්ත ජයලත් වීරසිංහ මහතා
02. ගරු උප සභාපති මාතරආරච්චිගේ ජයවීර මහතා
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. සුනිල් ශාන්ත මහතා
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. සුජිත් ප්‍රේමලාල් මහතා
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.එච්.සුනිල් මහතා
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.කේ.බී.සමීර රුක්ෂාන් මහතා
07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ කැළුම් වික්‍රමසිංහ මහතා
08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.සරත් වික්‍රමසූරිය මහතා
09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්. දසුන් මධුරංග වාසනා වික්‍රමගේ මහතා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඩබ්.එස්.එම්. අෂානි ප්‍රියංගිකා මහත්මිය
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රණී ඩී.එච්.සීතා පද්මණී මහත්මිය
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී රේණුකා ජීවානි අලහප්පෙරුම මහත්මිය
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ. සමන්ත රත්නායක මහතා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. අමිත් රණතුංග මහතා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස් චන්ද්‍රරත්න කුරුකුල මහතා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එම්.ඒ.ජී. අනෝමා රෝෂිණී නිලන්ති මෙනවිය
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඩබ්.එම්. ධම්මිකා නිලන්ති බණ්ඩාර මිය
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. මල්ක මදුභාෂන මහතා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එල්.ජී.රංජිත් මහතා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්රිණී එන්. ඒ. සාගරිකා පුෂ්ප කුමාරි මහත්මිය
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්. සුසන්ත කුමාරසිරි මහතා
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. චන්ද්‍රසිරි මහතා
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.පී. පැතුම් මධුසංක මහතා
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එල්.ඒ.කාන්තිලතා මහත්මිය
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්. ජී. බ්‍රෙසිල් නුවන් කුමාර මහතා
28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.නන්දසේන මහතා
29. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් මේනුක දිසානායක මහතා

**සහභාගි නොවූ සභික නාමාවලිය :-**

නැත.

**සහභාගි වූ නිලධාරින් :-**

01.ලේකම් (වැ.බ) - එච්.එල්.ප්‍රේමදාස මයා.

02.සංවර්ධන නිලධාරී - ඩී.කේ.නිසංසලා මිය.

**ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ 2022.09.16 දින පැවති මහ සභා රැස්වීමේ සංෂිප්ත වාර්තාවයි.**

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ 2022 සැප්තැම්බර් මස මහ සභා රැස්වීම ආරම්භ කිරීම සඳහා 2022.09.16 වන දින පෙ.ව.10.00ට ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා අසුන් ගන්නා ලදි. ආගමික වතාවත් සිදු කිරීමෙන් හා ජාතික ගීය ගායනා කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් පිළිගැනීමේ කථාව පවත්වන ලදී. ගරු සභාපතිතුමා විසින් පැමිණ සිටි ගරු උප සභාපතිතුමාත් ගරු සභික මණ්ඩලයත්,ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයත් පිළිගැනීමෙන් අනතුරුව න්‍යායපත්‍රානුකූලව සභාවේ කටයුතු ආරම්භ කරන ලදි.

**01.පසුගිය මහ සභා වාරයේ සභා වාර්තාව සභා සම්මත කිරීම.**

- 2022.08.18 වන දින පැවති මහ සභා වාරයේ සභා වාර්තාව සභා සම්මත කිරීම.

__ගරු සභාපති සුරන්ත ජයලත් මහතා__
ගරු මන්ත්‍රීතුමනි, 2022.08.18 වෙනි දින පැවති මහ සභා වාරයේ සභා වාර්තාව සභා සම්මත කිරීම සඳහා ඉදිරිපත් කර සිටිනවා.

__ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජිත් ප්‍රේමලාල් මහතා__
මෙම සභා වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කර සිටිනවා.

__ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා__
එම යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ 2022 අගෝස්තු මස 16 වැනි දින පැවති මහ සභා වාරයේ සභා වාර්තාවේ සංශෝධන නොතිබූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**02.ගරු සභාපතිතුමාගේ නිවේදන.**

**නැත.**

**03.සංදේශ/පෙත්සම්/පැමිණිලි ඉදිරිපත් කිරිම.**

**නැත.**

**04.යථා පරිදි කල්දී ඇති ප්‍රශ්ණ.**

**නැත.**

**05.යථා පරිදි කල් දී ඇති යෝජනා.**

**05.01) 2022 වර්ෂයට අදාලව ඉදිරිපත් කරනු ලබන ප්‍රථම පරිපූරක අයවැය ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

__ගරු සභාපති සුරන්ත ජයලත් මහතා__
2022 වර්ෂයට අදාලව ඉදිරිපත් කරනු ලබන ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ රු:8,012,860.00ක ප්‍රථම පරිපූරක අයවැය ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

__ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජිත් ප්‍රේමලාල් මහතා__
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, 2022 වර්ෂයට අදාලව ඉදිරිපත් කරනු ලබන රු:8,012,860.00ක ප්‍රථම පරිපූරක අයවැය ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.02) 2022 අගෝස්තු මස 1,000,000.00 ට වැඩි වියදම් සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

ගරු සභාපති සුරන්ත ජයලත් මහතා

2022 අගෝස්තු මස මෙම සභාවේ ලක්ෂ 10ට වැඩි වියදම් 02ක් සිදු කරල තියෙනවා. එය විස්තර සහිතව පහතින් දක්වනවා. ඒ සඳහා අනුමැතිය ලබාදීම සුදුසුයි කියලා මා යෝජනා කරනවා.

| අනු අංකය | දිනය | වවුචර් අංකය | චෙක්පත් අංකය | ආදායකයාගේ නම | ගෙවීම් විස්තරය | මුදල රු: |
|---|---|---|---|---|---|---|
| 01 | 2022.08.24 | 884 | 12602 සිට 12617 දක්වා | වැටුප් | කාර්ය මණ්ඩල වැටුප් (ස්ථිර) | 3,476,170.54 |
| 02 | 2022.08.29 | 912 | 12630 | සී/ස මුලුඇඩියාවල නැ/ ගම නැගුම ජනතා සමාගම | මුලුඇඩියාවල ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම | 1,720,657.89 |
| එකතුව | | | | | | **5,196,828.43** |

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රෙසිල් නුවන් කුමාර මහතා

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ 2022 අගෝස්තු මස රු:5,196,828.43 වූ ලක්ෂ 10ට වැඩි වියදම් සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.03) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගස්ථ මුදල් රක්ෂණාවරණය අළුත් කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

ගරු සභාපති සුරන්ත වීරසිංහ මහතා

අප සභාවේ දෛනික මුදල් හා චෙක්පත් බැංකුගත කිරීම හා චෙක්පත් මුදල් කර රැගෙන යන කාර්යයේ යෙදෙන නිලධාරීන් හා වාහනය වෙනුවෙන් ලබාගන්නා මාර්ගස්ථ මුදල් රක්ෂණය 2022.08.30 දිනට අවසන් වන නිසා එම මාර්ගස්ථ මුදල් රක්ෂණය අළුත් කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මා යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් වික්‍රමසූරිය මහතා

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව,ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ මාර්ගස්ථ මුදල් රක්ෂණ 2022.08.31 දින සිට වර්ෂයක කාල සීමාවක් සඳහා අළුත් කිරීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.04) 2023 වර්ෂය සඳහා ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු සතිපොල හා කඩකාමර බදුදීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

ගරු සභාපති සුරන්ත ජයලත් මහතා

මෙම සතිපොලවල නව තක්සේරුවක් අපි පසුගිය කාලේ සිදු කළා.නමුත් තවම අපට එහි වාර්තා ලැබිල නැහැ.නව තක්සේරු මුදල තවම දන්නේ නැති නිසා මේ පිළිබඳව තීරණයක් ගැනීමට නොහැකියි. එම නිසා මෙම යෝජනාව ඊළඟ සභා වාරයට කල් තැබීම සුදුසු බවට මම යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීත් ප්‍රේමලාල් මහතා

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, මෙම යෝජනාව ඊළඟ සභා වාරයට කල් තබන ලදී.**

**05.05) 2022 වර්ෂයේ පල්ලෙබැද්ද සතිපොල ජුනි මස වාරික මුදලින් 50%ක මුදලක් හා ජූලි මස වාරික මුදලින් 75%ක මුදලක් අඩු කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

රටේ පවතින අර්බුධකාරී වාතාවරණය හමුවේ සතිපොල වෙත වෙළෙඳුන්ගේ වගේම පාරිභෝගිකයන්ගේ පැමිණීම අඩු මට්ටමක පවතින නිසා සතිපොල ගාස්තු කපා හරින්න කියලා බදුකරුවන්ගෙන් දිගින් දිගටම ඉල්ලීම් ඉදිරිපත් වෙනවා. ඒ අනුව පල්ලෙබැද්ද සතිපොල 2022 ජුනි මස වාරික මුදලින් 50%ක මුදලක් හා ජූලි මස වාරික මුදලින් 75%ක මුදලක් කපා හරින්න කියලා බදුකරු ඉල්ලීමක් කරල තියෙනවා. ඒ පිළිබඳ විස්තරය මෙහෙමයි.

| සතිපොලේ නම | මාසික වාරික මුදල රු. | කපා හැරීමට තීරණය කළ ජුනි මස 50% මුදල (රු:) | කපා හැරීමට තීරණය කළ ජූලි මස 75% මුදල (රු:) | කපා හැරීමට තීරණය කළ සම්පූර්ණ මුදල (රු:) |
|---|---|---|---|---|
| පල්ලේබැද්ද සතිපොල | 117,090.00 | 58,545.00 | 87,817.50 | 146,362.50 |

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

ඒ අනුව ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවට අයත් පල්ලෙබැද්ද සතිපොලට අදාලව 2022 ජුනි මාසයට අදාල වාරික මුදලින් 50%ක මුදලක් (58,545.00ක්) කපා හැරීම සඳහාත්, 2022 ජූලි මස වාරික මුදලින් 75%ක මුදලක් (87,817.50) කපා හැරීම සඳහාත් (2022 ජුනි හා ජූලි මස කපා හැරීමට නියමිත සම්පූර්ණ මුදල රු:146,362.50) අනුමැතිය ලබාදීම සුදුසුයි කියල මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවට අයත් පල්ලෙබැද්ද සතිපොලට අදාලව 2022 ජුනි මාසයට අදාල වාරික මුදලින් 50%ක මුදලක් (58,545.00ක්) කපා හැරීම සඳහාත්, 2022 ජූලි මස වාරික මුදලින් 75%ක මුදලක් (87,817.50) කපා හැරීම සඳහාත් (2022 ජුනි හා ජූලි මස කපා හැරීමට නියමිත සම්පූර්ණ මුදල රු:146,362.50) අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.06) 2022 වර්ෂයේ මැයි, ජුනි හා ජූලි මස මුල්ඇඩියාවල සතිපොල වාරික මුදල් අඩු කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

රටේ පවතින අර්බුධකාරී වාතාවරණය හමුවේ සතිපොල වෙත වෙළෙඳුන්ගේ වගේම පාරිභෝගිකයන්ගේ පැමිණීම අඩු මට්ටමක පවතින නිසා සතිපොල ගාස්තු කපා හරින්න කියලා **මුල්ඇඩියාවල සතිපොල** බදුකරුගෙනුත් ඉල්ලීම් ඉදිරිපත් වුණා. ඒ අනුව මුල්ඇඩියාවල සතිපොල 2022 මැයි, ජුනි මස වාරික මුදලින් 50%ක මුදලක් හා ජූලි මස වාරික මුදලින් 75%ක මුදලක් කපා හරින්න කියලා බදුකරු ඉල්ලීමක් කරල තියෙනවා. ඒ පිළිබඳ විස්තරය මෙහෙමයි.

| සතිපොලේ නම | මාසික වාරික මුදල රු. | කපා හැරීමට තීරණය කළ මැයි මස 50% මුදල (රු:) | කපා හැරීමට තීරණය කළ ජුනි මස 50% මුදල (රු:) | කපා හැරීමට තීරණය කළ ජූලි මස 75% මුදල (රු:) | කපා හැරීමට තීරණය කළ මාස 03ක සම්පූර්ණ වාරික මුදල (රු:) |
|---|---|---|---|---|---|
| මුල්ඇඩියාවල සතිපොල | 89,918.00 | 44,959.00 | 44,959.00 | 67,438.50 | 157,356.50 |

ඒ අනුව ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවට අයත් මුල්ඇඩියාවල සතිපොලට අදාලව 2022 මැයි හා ජුනි මාසයන්ට අදාල වාරික මුදලින් 50%ක මුදලක් (89918.00ක්) කපා හැරීම සඳහාත්, 2022 ජූලි මස වාරික මුදලින් 75%ක මුදලක් (67,438.50ක්) කපා හැරීම සඳහාත් (2022 මැයි,ජුනි හා ජූලි මස කපා හැරීමට නියමිත සම්පූර්ණ මුදල රු:157,356.50ක්) අනුමැතිය ලබාදීම සුදුසුයි කියල මම යෝජනා කරනවා.

<u>ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා</u>

ගරු සභාපතිතුමණි,ඒ යෝජනාව මා ස්ථිර කරනවා.නමුත් මෙය කවුරුන් හෝ කෙනෙකුගේ පෙළඹවීමක්.මොකද මුල්ඇඩියාවල සතිපොල බදුකරුගෙන් ගිය මාසෙ ඉල්ලීමක් ඉදිරිපත් වුණේ නැහැ.අර සතිපොලවල ගාස්තු කපා හැරපු නිසා තමයි මොහුත් මේ වගේ ඉල්ලීමක් කරන්නේ.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවට අයත් මුල්ඇඩියාවල සතිපොලට අදාලව 2022 මැයි හා ජුනි මාසයන්ට අදාල වාරික මුදලින් 50%ක මුදලක් (89918.00ක්) කපා හැරීම සඳහාත්, 2022 ජූලි මස වාරික මුදලින් 75%ක මුදලක් (67,438.50ක්) කපා හැරීම සඳහාත් (2022 මැයි,ජුනි හා ජූලි මස කපා හැරීමට නියමිත සම්පූර්ණ මුදල රු:157,356.50ක්) අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.07) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු ආරක්ෂිත කැමරා පද්ධතිය වෙනුවෙන් අධිබලැති බැටරියක් හෝ අධි බලැති UPS එකක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

මෙම ප්‍රාදේශීය සභාව සතු ආරක්ෂිත කැමරා පද්ධතිය වෙනුවෙන් අධිබලැති බැටරියක් හෝ අධි බලැති UPS එකක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රෙසිල් නුවන් කුමාර මහතා</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු ආරක්ෂිත කැමරා පද්ධතිය වෙනුවෙන් අධිබලැති බැටරියක් හෝ අධි බලැති UPS එකක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.08) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සඳහා ආරෝපණ විදුලි පහන් (Charging Bulb) 20ක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

මෙම ප්‍රාදේශීය සභාව සඳහා ආරෝපණ විදුලි පහන් (Charging Bulb) 20ක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වාසනා වික්‍රමගේ මහතා</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සඳහා ආරෝපණ විදුලි පහන් (Charging Bulb) 20ක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.09) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ කුලියට ලබාදීමේ ගාස්තු සංශෝධනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ කුලියට ලබාදීමේ ගාස්තු සංශෝධනය කිරීම සුදුසුයි කියලා මම හිතනවා.ඒ පිළිබඳ විස්තර මෙහෙමයි.

| අනු අංකය | I වන තීරුව විස්තර | II තීරුව ගාස්තුව (රුපියල්) | | | |
|---|---|---|---|---|---|
| 01 | මෝටර්ග්‍රේඩරය | පැයකට - 6000.00 (ඉන්ධන රහිතව) | | | |
| 02 | බැකෝ යන්ත්‍රය | පැයකට - 3000.00 (ඉන්ධන රහිතව) | | | |
| 03 | ටිපර් රථය | පැය 08 ක දිනයකට - 12000.00 (ඉන්ධන රහිතව) | | | |
| 04 | ට්‍රැක්ටරය | දිනකට - 5000.00 (ඉන්ධන රහිතව) | | | |
| 05 | ගලි බවුසරය | නේවාසික | | ව්‍යාපාර | |
| | | බල ප්‍රදේශය තුල | බල ප්‍රදේශය පිට | බල ප්‍රදේශය තුල | බල ප්‍රදේශය පිට |
| | ප්‍රවාහනය සඳහා කි.මී.1 ට රු:175.00 බැගින් ගෙවිය යුතුය (සේවය සපයන ස්ථානයට යාමට හා ඒමට යන කිලෝමීටර ගණනට අමතරව බැහැර ලීමට යන 15 KM සඳහා ද කි.මී.1 ට රු:175.00 බැගින් 2625.00 ගෙවිය යුතුය | 5000.00 | 6000.00 | 6000.00 | 6500.00 |
| | | 175.00 | 175.00 | 175.00 | 175.00 |
| 06 | ජල බවුසරය<br>ප්‍රවාහනය සඳහා කි.මී.1 ට රු:122.00 බැගින් ගෙවිය යුතුය. (සේවය සපයන ස්ථානයට යාමට හා ඒමට) | දිනකට 2750.00 | | | |

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ කුලියට ලබාදීමේ ගාස්තු ඉහත පරිදි සංශෝධනය කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා.</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ කුලියට ලබාදීමේ ගාස්තු ඉහත පරිදි සංශෝධනය කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.10) 2021 භාණ්ඩ සමීක්ෂණයට අදාලව අබලි ද්‍රව්‍ය වෙන්දේසියේදී වෙන්දේසි නොවූ අබලි ද්‍රව්‍ය පිළිබඳ තීරණයක් ලබා ගැනීමට හා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

2021 භාණ්ඩ සමීක්ෂණයට අදාලව අබලි ද්‍රව්‍ය වෙන්දේසියේදී වෙන්දේසි නොවූ පහත සඳහන් අබලි ද්‍රව්‍ය පිළිබඳ තීරණයක් ගත යුතුයි.එම අබලි ද්‍රව්‍ය ලේඛණය මෙහෙමයි.

| අනු අංකය | භාණ්ඩයේ නම | ප්‍රමාණය | තක්සේරු වටිනාකම (රුපියල්) | ලබා ගත් අයගේ නම | ලදුපත් අංකය | ලබාගත් මුදල (රුපියල්) |
|---|---|---|---|---|---|---|
| 01 | 5735 ටැක්ටරයේ බෝල් ජොයින්ට් | 4 | (4*100) 400.00 | ලංසු ඉදිරිපත් නොවිය | - | - |
| 02 | LL-6987 පෙෂර් මීටරය | 1 | 200.00 | ලංසු ඉදිරිපත් නොවිය | - | - |
| 03 | CLUTCH PLATE LL-7529 | 1 | 800.00 | ලංසු ඉදිරිපත් නොවිය | - | - |
| 04 | BYCYCLE CHAIN | 1 | 50.00 | ලංසු ඉදිරිපත් නොවිය | - | - |
| 05 | FAN BELT | 3 | 20.00 | ලංසු ඉදිරිපත් නොවිය | - | - |
| 06 | BREAK LIGTH | 2 | 50.00 | ලංසු ඉදිරිපත් නොවිය | - | - |
| 07 | ඇලුමිනියම් රිම් කප් | 4 | (100*4) 400 | ලංසු ඉදිරිපත් නොවිය | - | - |
| 08 | PB-9856 FILTER | 1 | 20.00 | ලංසු ඉදිරිපත් නොවිය | - | - |
| 09 | මෝටර් ග්‍රේඩර් ටයර් | 5 | (500*5) 2500 | ලංසු ඉදිරිපත් නොවිය | - | - |
| 10 | ප්ලාස්ටික් ට්‍රේ | 1 | 10.00 | ලංසු ඉදිරිපත් නොවිය | - | - |
| 11 | තේ ජෝග්ගු | 2 | 20.00 | ලංසු ඉදිරිපත් නොවිය | - | - |
| 12 | කැල්කියුලේටර් | 25 | 5*25 | ලංසු ඉදිරිපත් නොවිය | - | - |
| 13 | තීන්ත පෑඩ් | 2 | 1*2 | ලංසු ඉදිරිපත් නොවිය | - | - |
| 14 | පංචර් | 4 | 5*4 | ලංසු ඉදිරිපත් නොවිය | - | - |
| 15 | ස්ටේප්ලර් | 10 | 2*4 | ලංසු ඉදිරිපත් නොවිය | - | - |
| 16 | ගෑස් ලිප් | 1 | 20.00 | ලංසු ඉදිරිපත් නොවිය | - | - |
| 17 | ඉවත් කරන ලද ආරක්ෂිත සපත්තු | 2 | 10.00 | ලංසු ඉදිරිපත් නොවිය | - | - |
| 18 | ස්ටේප්ලර් මැෂින් | 6 | 12.00 | ලංසු ඉදිරිපත් නොවිය | - | - |
| 19 | කතුර | 1 | 5.00 | ලංසු ඉදිරිපත් නොවිය | - | - |

**මේ පිළිබඳ වැඩි දුරටත් සාකච්ඡා කිරීම සඳහා ගරු සභාපති සුරන්ත ජයලත් මහතාගේ හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් වික්‍රමසූරිය මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදි.**

**මේ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව ගරු සභාපති සුරන්ත ජයලත් මහතාගේ හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රෙසිල් නුවන් කුමාර මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාවක් බවට පත් කරන ලදී.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

ඒ අනුව 2021 භාණ්ඩ සමීක්ෂණයට අදාලව අබලි ද්‍රව්‍ය වෙන්දේසියේදී වෙන්දේසි නොවූ ඉහත සඳහන් අබලි ද්‍රව්‍ය අතුරින් මුල්‍යාමය වටිනාකමක් ඇති ද්‍රව්‍ය නැවත වෙන්දේසි කිරීමටත්,ඉතිරි අබලි ද්‍රව්‍ය විනාශ කර දැමීමටත් සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, 2021 භාණ්ඩ සමීක්ෂණයට අදාලව අබලි ද්‍රව්‍ය වෙන්දේසියේදී වෙන්දේසි නොවූ ඉහත සඳහන් අබලි ද්‍රව්‍ය අතුරින් මුල්‍යාමය වටිනාකමක් ඇති ද්‍රව්‍ය නැවත වෙන්දේසි කිරීමටත්,ඉතිරි අබලි ද්‍රව්‍ය විනාශ කර දැමීමටත් සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

**05.11) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවට අයත් වරිපනම් බදු අය කරනු ලබන දේපලවල දැනට පවතින අයිතිකරුගේ නම තක්සේරු වාර්තාවෙහි සංශෝධනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවට අයත් වරිපනම් බදු අය කරනු ලබන පහත සඳහන් දේපලවල දැනට පවතින අයිතිකරුගේ නම තක්සේරු වාර්තාවෙහි සංශෝධනය කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රෙසිල් නුවන් කුමාර මහතා</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

එම නාම ලේඛණය මෙහෙමයි.

| අනු අං. | පාර | වරිපනම් අංකය | 2022 තක්සේරු ලේඛනයේ පවතින නම | කමිටුව විසින් "හිමිකම් කියයි" ලෙස සංශෝධනය කිරීමට අනුමත කල නම |
|---|---|---|---|---|
| 1 | උඩවලව තණමල්විල පාර වම | 127 | එස්.ඒ.ජයවර්ධන(හි.කි.) | කේ.කේ.එන්.ආරියජීව |
| 2 | උඩවලව තණමල්විල පාර වම | 519 | ඩබ්.එම්.සුනේත්‍රා කුමාරි(හි.කි.) | ආර්.සඳමාලි කඩුපිටිය |
| 3 | උඩවලව තණමල්විල පාර වම | 43 | ආර්.එම්.අතුකෝරල සහ උපාලි පද්මසිරි(හි.කි.) | ජේ.එම්.ඒ.මැණිකේ |
| 4 | උඩවලව තණමල්විල පාර වම | 7 | අජිත් පුෂ්පලාල්(හි.කි.) | ආර්.එම්.ඩී.තරනපාල |
| 5 | උඩවලව තණමල්විල පාර වම | 1 | එච්.ඒ.ප්‍රේමදාස, අජිත් පුෂ්පලාල්(හි.කි.) | පී.ජී.එස්.පී.පුස්වැල්ල |
| 6 | උඩවලව තණමල්විල පාර වම | 447 | පී.වික්‍රමසිංහ(හි.කි.) | පී.විපුල සඳරුවන් වික්‍රමසිංහ |

| | | | | |
|---|---|---|---|---|
| 7 | උඩවලව තණමල්විල පාර වම | 449 | පී.වික්‍රමසිංහ(හි.කි.) | පී.විපුල සඳරුවන් වික්‍රමසිංහ |
| 8 | උඩවලව තණමල්විල පාර දකුණ | 214 | ලසන්ත රෝහණ(හි.කි.) | පී.ජී.ලසන්ත රෝෂන් |
| 9 | උඩවලව තණමල්විල පාර දකුණ | 192 | අයිතිකරු | වර්ණසූරියගේ දමිත් අසංක පියරත්න |
| 10 | උඩවලව තණමල්විල පාර දකුණ | 386 | එච්.ජී.කුසුමාවතී(හි.කි.) | කේ.ඒ.ජනක ප්‍රසාද් |
| 11 | උඩවලව තණමල්විල පාර දකුණ | 304 | එස්.එච්.ප්‍රේමලතා (හි.කි.) | දළුවත්තගේ ශ්‍යාමලී දළුවත්ත |
| 12 | උඩවලව තණමල්විල පාර දකුණ | 412 | ජී.කේ.කේ.එන්.සදනි(හි.කි.) | ජේ.කේ.එම්.එන්.සජානි ගජධීර |
| 13 | උඩවලව තණමල්විල පාර දකුණ | 558 | චිත්‍රා සෝමපාල(හි.කි.) | ඒ.ඒ.ප්‍රේමසීලී |
| 14 | උඩවලව තණමල්විල පාර දකුණ | 608 | ඒ.ජේ.එම්.රංමැණිකේ(හි.කි.) | ඩබ්.එම්.ශ්‍රියානි ජයමැණිකේ |
| 15 | RET හන්දියේ සිට දකුණු ඇල පාර (වම) | 91/4 | ඒ.ඩී.නිලන්ත කුමාර (හි.කි) | කේ.අරෝෂා සදමාලි |
| 16 | RET හන්දියේ සිට දකුණු ඇල පාර (වම) | 209 | එස්.පන්ඩිතසේකර (හි.කි) | කේ.කේ.සරත් ප්‍රේමලාල් |
| 17 | RET හන්දියේ සිට දකුණු ඇල පාර (වම) | 211 | එස්.පන්ඩිතසේකර (හි.කි) | කේ.කේ.සරත් ප්‍රේමලාල් |
| 18 | RET හන්දියේ සිට දකුණු ඇල පාර (දකුණ) | 80 | එච්.එම්.වසන්ත කුමාර (හි.කි) | එච්.එම්.වසන්තා කුමාරි (හි.කි) |
| 19 | RET හන්දියේ සිට දකුණු ඇල පාර (දකුණ) | 50 | අයිතිකරු | පී.සරත් දිසානායක |
| 20 | උඩවලව රත්නපුර පාර වම | 7 | එච්.ඒ.ප්‍රේමදාස(හි.කි.) | පී.ජී.එස්.පී.පුස්වැල්ල |
| 21 | උඩවලව රත්නපුර පාර දකුණ | 16 | ඩබ්.ජේම්ස්, ප්‍රේමසිරි ජයසුන්දර (හි.කි.) | එස්.එල්.ඒ.අභය ජයසිංහ |
| 22 | උඩවලව රත්නපුර පාර දකුණ | 116 | ඩබ්.ඒ.වික්‍රමදාස(හි.කි.)ඩබ්.එම්.ටී.සී.වීරසේකර(හි.කි.) | ඩබ්.එම්.ටී.සී.වීරසේකර |
| 23 | උඩවලව රත්නපුර පාර දකුණ | 116 1/1 | ඩබ්.ඒ.වික්‍රමදාස(හි.කි.)ඩබ්.එම්.ටී.සී.වීරසේකර(හි.කි.) | ඩබ්.එම්.ටී.සී.වීරසේකර |
| 24 | උඩවලව රත්නපුර පාර දකුණ | 116 A | ඩබ්.ඒ.වික්‍රමදාස(හි.කි.)ඩබ්.එම්.ටී.සී.වීරසේකර(හි.කි.) | ඩබ්.එම්.ටී.සී.වීරසේකර |
| 25 | උඩවලව රත්නපුර පාර දකුණ | 116/1 | ඩබ්.ඒ.වික්‍රමදාස(හි.කි.)ඩබ්.එම්.ටී.සී.වීරසේකර(හි.කි.) | ඩබ්.එම්.ටී.සී.වීරසේකර |
| 26 | කොළඹගෙආර හම්බන්තොට පාර දකුණ | 562 | එල්.ඒ.ප්‍රේමවතී(හි.කි.) | ආර්.එස්.ලියනආරච්චි |

| | | | | |
|---|---|---|---|---|
| 27 | කොළඹගෙආර හම්බන්තොට පාර දකුණ | 560 | ආර්.එස්.ලියනාරච්චි(හි.කි.) | එල්.ඒ.ප්‍රේමවතී |
| 28 | කොළඹගෙආර හම්බන්තොට පාර දකුණ | 560 A | එල්.ඒ.ප්‍රේමාවතී(හි.කි.) | එල්.ඒ.ප්‍රේමවතී |
| 29 | කොළඹගෙආර හම්බන්තොට පාර දකුණ | 426/10 | ආර්.ඒ.පුංචි මැණිකේ(හි.කි.) ආර්.ඒ.කරුණාවතී(නව හි.කි.) | ඒ.ඩබ්. රොෂාන් සෙනෙවිරත්න |
| 30 | කොළඹගෙආර හම්බන්තොට පාර දකුණ | 180 | පී.මාටින් පෙරේරා(හි.කි.) | පී.එල්.භාග්‍යා රුචිනි පී ලියනගේ ඩබ්.එච්.සුපුන් අසංක රත්නපාල |
| 31 | කොළඹගෙආර හම්බන්තොට පාර වම | 267 | අයිතිකරු | එච්.කේ.ජී.ශිරානී |
| 32 | හම්බන්තොට පාර දකුණ | 2056 | සම්පත්(හි.කි) | කේ.ඒ.නිමල් වසන්ත |
| 33 | හම්බන්තොට පාර දකුණ | 1434 | රොෂාන්(හි.කි) | එම්.ඒ.ඒ.දිල්රුක්ෂි |
| 34 | හම්බන්තොට පාර දකුණ | 1436 | රොෂාන්(හි.කි) | එම්.ඒ.ඒ.දිල්රුක්ෂි |

➢ **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවට අයත් වරිපනම් බදු අය කරනු ලබන ඉහත සඳහන් දේපලවල දැනට පවතින අයිතිකරුගේ නම තක්සේරු වාර්තාවෙහි සංශෝධනය කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

**05.12) පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් පළාත් පාලන ආයතනවල නිලධාරීන් උදෙසා පවත්වනු ලබන ප්‍රසම්පාදනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවට නිලධාරියෙකු සහභාගි කරවීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් පළාත් පාලන ආයතනවල නිලධාරීන් උදෙසා පවත්වනු ලබන ප්‍රසම්පාදනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවට නිලධාරියෙකු සහභාගි කරවීම සඳහා සභාවේ අනුමැතිය ඉල්ලලා තිබෙනවා.පාඨමාලා ගාස්තුව රු:25,000.00ක්.මේ සඳහා අනුමැතිය ලබාදීම සුදුසුයි කියල මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් වික්‍රමසූරිය මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

➢ **ඒ අනුව, පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් පළාත් පාලන ආයතනවල නිලධාරීන් උදෙසා පවත්වනු ලබන ප්‍රසම්පාදනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවට නිලධාරියෙකු සහභාගි කරවීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

**05.13) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු LK 9633 අංක දරණ ටිපර් රථයේ බ්‍රේක් පද්ධතිය ආශ්‍රිත අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු LK 9633 අංක දරණ ටිපර් රථයේ බ්‍රේක් පද්ධතිය ආශ්‍රිත අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමීර රුක්ෂාන් මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු LK 9633 අංක දරණ ටිපර් රථයේ බ්‍රේක් පද්ධතිය ආශ්‍රිත අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

**05.14) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු RD 6440 අංක දරණ ට්‍රැක්ටරයේ මෝටරය ආශ්‍රිත අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු RD 6440 අංක දරණ ට්‍රැක්ටරයේ මෝටරය ආශ්‍රිත අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වාසනා වික්‍රමගේ මහතා</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු RD 6440 අංක දරණ ට්‍රැක්ටරයේ මෝටරය ආශ්‍රිත අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

**05.15) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු RD 7993 අංක දරණ ට්‍රැක්ටරයේ බ්‍රේක් පද්ධතිය ආශ්‍රිත අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු RD 7993 අංක දරණ ට්‍රැක්ටරයේ බ්‍රේක් පද්ධතිය ආශ්‍රිත අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රේසිල් නුවන් කුමාර මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු RD 7993 අංක දරණ ට්‍රැක්ටරයේ බ්‍රේක් පද්ධතිය ආශ්‍රිත අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

**05.16) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ, කරවිලයාය ප්‍රදේශයේ ස්ථානයක් සඳහා 3'x8' ප්‍රමාණයේ හියුම් පයිප්ප 02ක් හා පල්ලෙබැද්ද යෝජිත බස් නැවතුම්පොල සහ පනාමුර ඇත්ගාල මාර්ගය සඳහා 2'x8'ප්‍රමාණයේ හියුම් පයිප්ප 06ක් මිලදී ගැනීම සඳහාත්,පදලංගල පොදු සුනාන භූමියේ වැට සකස් කිරීම සඳහා කම්බි කණු 90ක් මිලදී ගැනීම සඳහාත්, අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ, කරවිලයාය ප්‍රදේශයේ ස්ථානයක් සඳහා 3'x8' ප්‍රමාණයේ හියුම් පයිප්ප 02ක් හා පල්ලෙබැද්ද යෝජිත බස් නැවතුම්පොල සහ පනාමුර ඇත්ගාල මාර්ගය සඳහා 2'x8'ප්‍රමාණයේ හියුම් පයිප්ප 06ක් මිලදී ගැනීම සඳහාත්,පදලංගල පොදු සුනාන භූමියේ වැට සකස් කිරීම සඳහා කම්බි කණු 90ක් මිලදී ගැනීම සඳහාත්, අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා</u>

ගරු සභාපතිතුමණි, "ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ, කරවිලයාය ප්‍රදේශයේ ස්ථානයක් සඳහා 3'x8' ප්‍රමාණයේ හියුම් පයිප්ප 02ක් යෙදීම" කියන යෝජනාවේ ස්ථානය නිශ්චිත කරලා නැති නිසා ඒ යෝජනාව හැර ඉතිරි යෝජනා ටික මා ස්ථිර කරනවා. අර යෝජනාවේ ස්ථානය නිශ්චිත කරලා ලබන සභා වාරයකට ඉදිරිපත් කරන්න.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ, කරවිලයාය ප්‍රදේශයේ ස්ථානයක් යන්නෙහි ස්ථානය නිශ්චිත කර නැවත සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බවටත්, පල්ලෙබැද්ද යෝජිත බස් නැවතුම්පොල සහ**

**පනාමුර ඇත්ගාල මාර්ගය සඳහා 2'x8'ප්‍රමාණයේ හියුම් පයිප්ප 06ක් මිලදී ගැනීම සඳහාත්,පදලංගල පොදු සුනාන භූමියේ වැට සකස් කිරීම සඳහා කම්බි කණු 90ක් මිලදී ගැනීම සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

- **2022.01.20 දින මහ සභාවේ හදිසි යෝජනා යටතේ සභාගත කරන ලද, පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් විධිමත් පරිදි නැවත න්‍යාය පත්‍රයට ඇතුළත් කර නිවැරදි තීරණයන්ට එළඹිය යුතු බවට උපදෙස් දෙන ලද යෝජනා.**

**05.17) කැලි කසල බැහැර කිරීම විධිමත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

කැලි කසල බැහැර කිරීම විධිමත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කර සිටිනවා.

<u>ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා.</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, කැලි කසල බැහැර කිරීම විධිමත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.18) උඩවලව මුදුන්මංකඩ ක්‍රීඩා පිටියේ දැල් වැට ඉදිකිරීම වෙනුවෙන් සකස් කරන ලද රු: 1,450,000.00ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා.</u>

උඩවලව මුදුන්මංකඩ ක්‍රීඩා පිටියේ දැල් වැට ඉදිකිරීම වෙනුවෙන් සකස් කරන ලද රු:1,450,000.00ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීම සුදුසුයි කියල මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.එච්.සුනිල් මහතා.</u>

ඒ යෝජනාව මම ස්ථිර කරනවා.

- **ඒ අනුව, උඩවලව මුදුන්මංකඩ ක්‍රීඩා පිටියේ දැල් වැට ඉදිකිරීම වෙනුවෙන් සකස් කරන ලද රු:1,450,000.00ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට, ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.19) පහත සඳහන් ඇස්තමේන්තු සංශෝධනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

| අනු අංකය | ඇස්තමේන්තුවේ නම | සංශෝධිත ඇස්තමේන්තු මුදල (රු:) |
|---|---|---|
| **01.** | මහයාය විහාරස්ථාන මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම | **1,425,500.00** |
| **02.** | තුංකම වැව්සිරිගම චාමර මහතාගේ නිවස මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම | **1, 105,600.00** |
| **03.** | කදුරුගස්ආර කච්චිගල මාර්ගයේ,කච්චිගල පාසල් මාවතේ සපත්තු පාලම සහ පැතිබැම්ම ඉදිකිරීම | **491,000.00** |
| **04.** | තෝරගල කනත්ත ඉදිරිපිට මාර්ගය සංවර්ධනය කිරීම | **1,183,500.00** |

| | | |
|---|---|---|
| **05.** | **රංචමඩම තලාව මාර්ගයේ පැතිබැම්ම ඉදිකිරීම** | **546,300.00** |

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>
ඉහත සඳහන් ඇස්තමේන්තු මීට පෙර අපි සභාවට ඉදිරිපත් කරල අනුමැතිය අරන් තියෙන්නේ.නමුත් එම ඇස්තමේන්තුවල ඇස්තමේන්තු ගත මුදල ඉහත පරිදි සංශෝධනය කිරීමට අවශ්‍යයයි. මේ සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා</u>
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඉහත සඳහන් ඇස්තමේන්තු සංශෝධනය කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ කැළුම් වික්‍රමසිංහ මහතා විසින් සභා ගත කරන ලද යෝජනාව.</u>

**05.20) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා අරමුදලින් ඉදි කළ මැදකිවුල ක්‍රීඩා පිටි ගොඩනැගිල්ලට විදුලිය හා ජලය ලබා ගැනීම සඳහාත්,වැසිකිලි පද්ධතියක් ඉදි කිරීම සඳහාත් අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ කැළුම් වික්‍රමසිංහ මහතා</u>
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා අරමුදලින් ඉදි කළ මැදකිවුල ක්‍රීඩා පිටි ගොඩනැගිල්ලට විදුලිය හා ජලය ලබා ගැනීම සඳහාත්,වැසිකිලි පද්ධතියක් ඉදි කිරීම සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රෙසිල් නුවන් කුමාර මහතා</u>
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා අරමුදලින් ඉදි කළ මැදකිවුල ක්‍රීඩා පිටි ගොඩනැගිල්ලට විදුලිය හා ජලය ලබා ගැනීම සඳහාත්,වැසිකිලි පද්ධතියක් ඉදි කිරීම සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සුනිල් ශාන්ත මහතා විසින් සභා ගත කරන ලද යෝජනා.</u>

**05.21) සමදරාවේ සිට කාවන්තිස්සපුර දක්වා මාර්ගය 2Km ක කොටස සංවර්ධනය කිරීම සඳහා ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු මෝටර්ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව ලබාගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සුනිල් ශාන්ත මහතා</u>
සමදරාවේ සිට කාවන්තිස්සපුර දක්වා මාර්ගය 2Km ක කොටස සංවර්ධනය කිරීම සඳහා ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු මෝටර්ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව ලබාගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමීර රුක්ෂාන් මහතා</u>
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, සමදරාවේ සිට කාවන්තිස්සපුර දක්වා මාර්ගය 2Km ක කොටස සංවර්ධනය කිරීම සඳහා ඇඹිලිපිටිය ප්රාදේශීය සභාව සතු මෝටර්ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව ලබාගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.22) වල්ජූල හන්දියේ සිට මහපැලැස්ස වැව දක්වා මාර්ගය 2Km ක කොටස සංවර්ධනය කිරීම සඳහා ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු මෝටර්ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව ලබාගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සුනිල් ශාන්ත මහතා</u>

වල්ජූල හන්දියේ සිට මහපැලැස්ස වැව දක්වා මාර්ගය 2Km ක කොටස සංවර්ධනය කිරීම සඳහා ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු මෝටර්ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව ලබාගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වාසනා වික්‍රමගේ මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, වල්ජූල හන්දියේ සිට මහපැලැස්ස වැව දක්වා මාර්ගය 2Km ක කොටස සංවර්ධනය කිරීම සඳහා ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු මෝටර්ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව ලබාගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.23) වල්ජූල හන්දියේ සිට බලාගාර මාර්ගය දක්වා 2Km ක කොටස සංවර්ධනය කිරීම සඳහා ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු මෝටර්ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව ලබාගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සුනිල් ශාන්ත මහතා</u>

වල්ජූල හන්දියේ සිට බලාගාර මාර්ගය දක්වා 2Km ක කොටස සංවර්ධනය කිරීම සඳහා ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු මෝටර්ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව ලබාගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්ද්‍රරත්න කුරුකුල මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, වල්ජූල හන්දියේ සිට බලාගාර මාර්ගය දක්වා 2Km ක කොටස සංවර්ධනය කිරීම සඳහා ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු මෝටර්ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව ලබාගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.24) කණබැදිආර පන්සල මාර්ගය දක්වා 1Km ක කොටස සංවර්ධනය කිරීම සඳහා ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු මෝටර්ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව ලබාගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සුනිල් ශාන්ත මහතා</u>

කණබැදිආර පන්සල මාර්ගය දක්වා 1Km ක කොටස සංවර්ධනය කිරීම සඳහා ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු මෝටර්ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව ලබාගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමීර රුක්ෂාන් මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, කණබැදිආර පන්සල මාර්ගය දක්වා 1Km ක කොටස සංවර්ධනය කිරීම සඳහා ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු මෝටර්ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව ලබාගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු**

**බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.25) වීරසිංහපුර ගම්මාන මාර්ගය 1Km ක කොටස සංවර්ධනය කිරීම සඳහා ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු මෝටර්ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව ලබාගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සුනිල් ශාන්ත මහතා</u>

වීරසිංහපුර ගම්මාන මාර්ගය 1Km ක කොටස සංවර්ධනය කිරීම සඳහා ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු මෝටර්ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව ලබාගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, වීරසිංහපුර ගම්මාන මාර්ගය 1Km ක කොටස සංවර්ධනය කිරීම සඳහා ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු මෝටර්ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව ලබාගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06.හදිසි යෝජනා.**

**06.01) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු ජල බවුසරයේ පළුදු වූ ස්ථාන අළුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු ජල බවුසරයේ පළුදු වූ ස්ථාන අළුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමීර රුක්ෂාන් මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු ජල බවුසරයේ පළුදු වූ ස්ථාන අළුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06.02) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු ZA 5014 අංක දරණ බැකෝ ලෝඩර් යන්ත්‍රෙය් එයාර් ෆිල්ටර්, ඔයිල් ෆිල්ටර්,ඩීසල් ෆිල්ටර් අළුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු ZA 5014 අංක දරණ බැකෝ ලෝඩර් යන්ත්‍රෙය් එයාර් ෆිල්ටර්, ඔයිල් ෆිල්ටර්,ඩීසල් ෆිල්ටර් අළුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්ද්‍රරත්න කුරුකුල මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු ZA 5014 අංක දරණ බැකෝ ලෝඩර් යන්ත්‍රෙය් එයාර් ෆිල්ටර්, ඔයිල් ෆිල්ටර්,ඩීසල් ෆිල්ටර් අළුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06.03)** තක්සේරු දෙපාර්තමේන්තුවෙහි තක්සේරු නිලධාරීන්ගේ හිඟයක් පවතින බැවින්, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ දේපල කළමණාකරන හා තක්සේරු විද්‍යා උපාධිය ලබා සිටින උපාධිධාරීන් බඳවාගෙන පළාත් පාලන ආයතන සතු නව දේපල තක්සේරු කිරීමේ කටයුතු සිදු කළ හැකි බවට තක්සේරු දෙපාර්තමේන්තුව

විසින් දන්වා ඇති අතර, එම උපාධිධාරීන් යොදවාගෙන ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු නව දේපල තක්සේරු කටයුතු සිදු කිරීම සඳහාත්,ඒ වෙනුවෙන් එක් ඒකකයක් සඳහා රු:60.00 බැගින් ගෙවීම් කටයුතු සිදු කිරීම සඳහාත්, තීරණයක් ලබා ගැනීමට හා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

තක්සේරු දෙපාර්තමේන්තුවෙහි තක්සේරු නිලධාරීන්ගේ හිඟයක් පවතින බැවින්, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ දේපල කළමණාකරන හා තක්සේරු විද්‍යා උපාධිය ලබා සිටින උපාධිධාරීන් බඳවාගෙන පළාත් පාලන ආයතන සතු නව දේපල තක්සේරු කිරීමේ කටයුතු සිදු කළ හැකි බවට තක්සේරු දෙපාර්තමේන්තුව විසින් දන්වලා තිබෙනවා. එම උපාධිධාරීන් යොදවාගෙන ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු නව දේපල තක්සේරු කටයුතු කිරීමේදී,ඒ වෙනුවෙන් එක් ඒකකයක් සඳහා රු:60.00 බැගින් ගෙවීමට සිදු වෙනවා. එම උපාධිධාරීන් යොදවාගෙන ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු නව දේපල තක්සේරු කටයුතු සිදු කිරීම සඳහාත්,ඒ වෙනුවෙන් එක් ඒකකයක් සඳහා රු:60.00 බැගින් ගෙවීම් කටයුතු සිදු කිරීම සඳහාත්, අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, තක්සේරු දෙපාර්තමේන්තුවෙහි තක්සේරු නිලධාරීන්ගේ හිඟයක් පවතින බැවින්, තක්සේරු දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇති පරිදි ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ දේපල කළමණාකරන හා තක්සේරු විද්‍යා උපාධිය ලබා සිටින උපාධිධාරීන් යොදවාගෙන ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු නව දේපල තක්සේරු කටයුතු සිදු කිරීම සඳහාත්,එම නිලධාරීන් හට එක් ඒකකයක් වෙනුවෙන් රු:60.00 බැගින් ගෙවීම් කටයුතු සිදු කිරීම සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**07.කාරක සභා වාර්තා සලකා බැලීම.**

- **2022.08.31 වැනි දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා.</u>

2022.08.31 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව අනුමැතිය සඳහා ඉදිරිපත් කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගමගේ අමිත් රණතුංග මහතා</u>

2022.08.31 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව සංශෝධනයන්ට යටත්ව අනුමැතිය ලබාදීම සුදුසු බවට මා යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ කැළුම් වික්‍රමසිංහ මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව 2022.08.31 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාවේ සංශෝධන නොතිබූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**08.මාසික ආදායම් වියදම් වාර්තා සලකා බැලීම.**

- **I. 2022 අගෝස්තු මස ලැබීම් සාරංශය.**
- **II. 2022 අගෝස්තු මස ගෙවීම් සාරංශය.**
- **III. 2022.08.31 දිනට අදායම් එකතු කිරීමේ ප්‍රගති වාර්තා.**
- **IV. 2022 අගෝස්තු මස ලක්ෂ 10ට වැඩි වියදම්.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා.</u>

2022 අගෝස්තු මාසයට අදාළ ඉහත සඳහන් වාර්තා සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජිත් ප්‍රේමලාල් මහතා**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, 2022 අගෝස්තු මාසයට අදාළ ඉහත සඳහන් වාර්තා සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ හෙයින් ඒකමතිකව සභා සම්මත විය.**

**09.වෙනත් කරුණු**

**ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා**

ගරු සභාපතිතුමණි,ප්‍රාදේශීය සභා කාල සීමාව අවසන් වීගෙන යන මොහොතක හෝ නව පළාත් පාලන රාජ්‍ය අමාත්‍යවරයා හැටියට රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු පත්වීම අපිට මහත් අභිමානයක් විදියට අපි සලකනවා.රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ජානක වක්කුඹුර මහතා නව පළාත් පාලන රාජ්‍ය අමාත්‍යවරයා විදියට පසුගිය දිනයක දිවුරුම් දුන්නා.ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා තමයි අපට ඒ අවස්ථාව උදා කරලා දුන්නේ. පළාත් පාලන ආයතනයක මන්ත්‍රීවරු විදියට ඒක අපට ගොඩක් වටිනවා.ජානක වක්කුඹුර කියන චරිතය රටට,පළාතට සේවයක් කරපු චරිතයක් විදියට අපි දකිනවා. 1991 පළාත් සභාව තුළ පළාත් පාලන ඇමතිවරයා විදියට මහේෂ් දනන්සූරිය මැතිතුමා හිටියා.ඉන් පසුව මම හිතන විදියට අපේ දිස්ත්‍රික්කයෙන් පළාත් පාලන රාජ්‍ය ඇමතිවරයෙක් පත්වුණ පළමු අවස්ථාව මේක.ඒ පිළිබඳව සුභ පැතුම් අපි එතුමට පිරිනමනවා.එතුමාට මේ අමාත්‍යධූරය ලබාදීම සම්බන්ධව ගරු ජනාධිපතිතුමාටත්,රජයටත්, ඒ ධූරය භාරගත්ත ඇමතිතුමාටත් ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ උප සභාපතිවරයා විදියට මගේ පුද්ගලික ස්තූතිය පිරිනමනවා.ඒ වගේම එතුමාට සුභ පතනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා**

ගරු සභාපතිතුමණි,උප සභාපතිතුමා කිව්වා වගේ කලවාන ප්‍රාදේශීය සභාවේ උප සභාපතිවරයා විදියට ඉඳලා වත්මන් පළාත් පාලන රාජ්‍ය අමාත්‍යවරයා විදියට පත්වෙලා ඉන්න ගරු ජානක වක්කුඹුර මැතිතුමා භාර ගත්ත හැම අමාත්‍යධූරයක්ම නිසියාකාරව ඉටු කරපු, විශාල වැඩ කොටසක් කරපු විශේෂයෙන් රත්නපුර දිස්ත්‍රික්කය වෙනුවෙන් විශාල කාර්යයභාරයක් ඉටු කරපු අමාත්‍යවරයෙක්.ඒ වගේම සමස්ත රටේම විශාල කාර්යභාරයක් ඉටු කරපු අමාත්‍යවරයෙක්.මම විශ්වාස කරනවා පළාත් පාලනයේ හිටපු උප සභාපතිවරයෙක් මන්ත්‍රීවරයෙක් විදියට එතුමා මේ කෙටි කාලය තුළ හෝ පළාත් පාලන ආයතන කෙරෙහි අවධානය යොමු කරලා යම්කිසි සේවාවක් සිදු කරයි කියලා.ඒ අනුව එතුමා රාජ්‍ය අමාත්‍යවරයෙක් විදියට පත්කිරීම සම්බන්ධව අපි සියළු දෙනාගේම ස්තූතිය පළ කරමින් එතුමාට රාජ්‍ය අමාත්‍ය ධූරයේ වැඩ කටයුතු කරගෙන යන්න අවශ්‍ය ශක්තිය ධෛර්යය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

**ගරු සභාපති සුරන්ත ජයලත් මහතා.**

ගරු ජානක වක්කුඹුර මැතිතුමා රාජ්‍ය අමාත්‍යධූරයකට පත්වීම ඇත්තටම අපි සියළු දෙනාටම ලොකු සතුටක්,අභිමානයක්.සියළු දෙනාම අදහස් ප්‍රකාශ නොකළත් සියළු දෙනාම ජානක වක්කුඹුර කියන චරිතයට කැමතියි.එතුමා මේ තනතුරට පත්වීම අපට ලොකු අවස්ථාවක්.එතුමා ඇඹිලිපිටිය ප්‍රා දේශීය සභාවේ ගැටළු නිරාකරණය කරගන්න, මේ ගොඩනැගිල්ලත් ඇතුළුව,අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නව කියලා මට පොරොන්දු වුණා.එතුමට සියළු පළාත් පාලන ආයතනවල ගැටළු නිරාකරණය කිරීම සඳහා අවශ්‍ය සියළු ශක්තිය වාසනාව ලැබෙන්න කියලා මම සියළු මන්ත්‍රීවරුන් වෙනුවෙන් ප්‍රාර්ථනා කරනවා.

- **ගරු සභාපති තුමාගේ ස්තූති කථාව.**

අද දින මහ සභාවේ කටයුතු සාර්ථක කර ගැනීමට සහාය ලබා දුන් සියලුම ගරු මන්ත්‍රී මණ්ඩලයටත් ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලයටත් මාගේ ගෞරව පුර්වක ස්තූතිය පුදකර සිටිනවා.

2022.09.16 වන දින පැවති මහ සභාව ප.ව. 1.00ට පමණ නිමාවට පත් විය.

සුරන්ත වීරසිංහ,
සභාපති,
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව,
තුංකම.